DOI: 10.31357/fhssphd.2015.00086

# ශ්‍රී ලංකාවේ ඊශ්වර දේව වන්දනාව

ඩබ්ලිව්.වී.පී. හිමාලිකා රණවීර

GS/MPhil/CS/3373/08

දර්ශනසූරි 2014

# ශ්‍රී ලංකාවේ ඊශ්වර දේව වන්දනාව

**ඩබ්ලිව්.වී.පී. හිමාලිකා රණවීර**

**GS/MPhil/CS/3373/08**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සංස්කෘතික අධ්‍යයනය දර්ශනසූරි උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධය**

2014

## පර්යේෂක ප්‍රකාශය

මේ නිබන්ධයට ඇතුළත් කර ඇති "ශ්‍රී ලංකාවේ ඊශ්වර දේව වන්දනාව" නම් වූ ස්වාධීන පර්යේෂණ කාර්යය උපදේශකවරුන්ගේ උපදේශකත්වය යටතේ සිදු කළ බවත්, වාචික පරීක්ෂණයේ දී පරීක්ෂක මණ්ඩලය විසින් ලබා දුන් සංශෝධන සහිත ව ඉදිරිපත් කරන බවත්, මෙම පර්යේෂණයට අදාළ ව පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් හෝ කිසිදු වාර්තාවක් වෙනත් උපාධියක්/ඩිප්ලෝමාවක් සඳහා කිසිදු විශ්වවිද්‍යාලයකට හෝ වෙනත් අධ්‍යයන ආයතනයකට හෝ ඉදිරිපත් කර නොමැති බවත් මෙයින් සහතික කර ප්‍රකාශ කර සිටිමි.

Ranaweera ........................ 2015.07.06 ..................

නම දිනය

## උපදේශකවරුන්ගේ ප්‍රකාශය

ඩබ්ලිව්.වී.පී. හිමාලිකා රණවීර (GS/MPhil/CS/3373/08) නම් වන දර්ශනපූරී උපාධි අපේක්ෂිකාව විසින් කරනු ලැබ ඇති ප්‍රකාශය සත්‍ය බවත්, අපගේ උපදේශකත්වය යටතේ සිදු කළ මෙම පර්යේෂණ නිබන්ධය විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත්, වාචික පරීක්ෂණයේ දී පරීක්ෂක මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද සියලු සංශෝධන සහිත ව නිබන්ධය සකසා ඇති බවත් සහතික කරමු.

..............................

මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ

මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ
භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය.
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
ගංගොඩවිල, නුගේගොඩ

2015. 07. 07

දිනය

..............................

මහාචාර්ය බණ්ඩාර මැණිකේ විජේතුංග

07 - 07 - 2015

දිනය

## අධ්‍යයනාංශ ප්‍රධානතුමාගේ ප්‍රකාශය

සංස්කෘතික අධ්‍යයන විෂය යටතේ දර්ශනසූරි උපාධිය සඳහා ලියාපදිංචි වී සිටින ඩබ්ලිව්.වී.පී. හිමාලිකා රණවීර (GS/MPhil/CS/3373/08) විසින් "ශ්‍රී ලංකාවේ ඊශ්වර දේව වන්දනාව" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කරන ලද ස්වාධීන පර්යේෂණ නිබන්ධය විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බව නිර්දේශ කරමි.

............................................ 2015/07/08 ............................................

අධ්‍යයනාංශ ප්‍රධාන දිනය

භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශය,

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,

ගංගොඩවිල, නුගේගොඩ

## පිදුම

ගුණ නැණ දහමින් සවිමත් කරමින්

මගේ ලෝකය ගොඩ නගන්නට අත්වැලක් වූ

දයාලු සැමට බැති සිතින් පුදමි

# උපකාරානුස්මෘති

අධ්‍යයන අවශ්‍යතා නිසි පරිදි සකසා දෙමින් පර්යේෂණයෙහි ලා මා යොමු කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති ආචාර්ය එන්. එල්. ඒ. කරුණාරත්න මහාත්මා, මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨයේ පීඨාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සී. එල්. නවරත්න මහාත්මා, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිනිය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ස්වර්ණා පියසිරි මහාත්මිය, භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ වර්තමාන අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සංගීතපති දර්ශන ප්‍රදීප් රත්නායක මහාත්මා මෙන් ම අතීත අධ්‍යයනාංශ ප්‍රධානවරුන්, මානව ශාස්ත්‍ර අධ්‍යයන මණ්ඩලයේ වර්තමාන සභාපති මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ මහාත්මා මෙන් ම අතීත සභාපතිවරුන් අදාළ මානව ශාස්ත්‍ර අධ්‍යයන මණ්ඩලය ප්‍රථමයෙන් ම සිහිපත් කරන්නේ ඔවුන්ගේ අවසරය හා අනුග්‍රහයෙන් තොර ව පර්යේෂණය කාර්යය සිදු කළ නොහැකි බැවිනි.

අධ්‍යයන මාතෘකා සකසමින් පර්යේෂණය ආරම්භ කළ දිනයේ පටන් අවසාන පිටපත සකසා නිමවන තුරු ම නිසි මග පෙන්වා දුන්, දැඩි පිළිවෙතින් තොර මෘදු පිළිවෙතින් ස්වාධීන පර්යේෂණ කාර්යයක් සඳහා අවැසි නිදහස හා මානසික සුවය ලබා දුන් මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ ඇදුරුතුමන් ද මහාචාර්ය බණ්ඩාර මැණිකේ විජේතුංග ඇදුරුතුමිය ද සිහිපත් කරන්නේ හද පිරි භක්ත්‍යාදරයෙනි. සැමදා පහන් සිතින් මා දිවියට ආසිරි ගෙන දෙන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මනෝරි මනම්පේරි ඇදුරුතුමියත්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය විජය ශ්‍රී විතාරණ ඇදුරුතුමන් ඇතුළු පර්යේෂණයේ දී මා හට උපකාර කළ සියලු ම ගුරු භවතුන් හා භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසංගික කලා අධ්‍යයනාංශයේ ස්ථිර, තාවකාලික හා බාහිර ආචාර්ය මණ්ඩලයටත් තුති පුද කරමි.

පොත්පත් අතර සිරවෙමින් සිටිය දී මා හට නිබඳ සහාය දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිනිය ඇතුළු කාර්ය මණ්ඩලයත්, කොළඹ ප්‍රදේශාශ්‍රිත පුස්තකාලයවලට අනුබද්ධ නිලධාරී මහත්ම මහත්මාවනුත් සිහිපත් කරන්නේ ඔබගේ හිතවත් බව මා නිරන්තරයෙන් පුස්තකාලය වෙත රැගෙන ගිය බැවිනි. පර්යේෂණයේ මූල්‍ය බර ඉසිලූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ WCUP/USJP ව්‍යාපෘතියට හා එහි අතීත

අධ්‍යක්ෂතුමිය හා වර්තමාන අධ්‍යක්ෂතුමන් ඇතුළු කාර්ය මණ්ඩලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය අංශයට හා පශ්චාද් උපාධි අධ්‍යයනාංශයේ නිලධාරී මහත්ම මහත්මීන්ටත් තුති පුද කරමි. පර්යේෂණයට අවශ්‍ය සහාය නොපිරිහෙළා ලැබීමෙන් මාගේ පර්යේෂණයට ඔබ ද රුකුලක් විය.

ප්‍රශ්නාවලි ලබා ගැනීමේ දී හා පොත්පත් ලබා ගැනීමේ දී උපකාර කළ සියලු දෙනාමත්, ක්ෂේත්‍ර අධ්‍යයනවලදී දත්ත දායකයන් හා සම්පත් දායකයන් වූ සියලු දෙනාටත් මගේ ප්‍රණාමය දක්වන්නේ ඔබගේ සේවය, දැනුම හා සිතුම් පැතුම් පර්යේෂණයේ අකුරු අතරට ගොනු වී තිබෙන බැවිනි. ඔබෙන් ලද සේවය අගනේ ය. එනිසා ඊට බොහෝ තුති.

මා දිවියේ නිති දිරියක්, ශක්තියක් වූ මාගේ දයාබර දෙමාපියන් හා ස්වාමි පුරුෂයාගේ මව්පිය දෙදෙනාත්, ක්ෂේත්‍ර චාරිකාවලදී මා හා එක් වූ සොයුරු සොයුරියන්වත්, සැමදා මා හට ආශිර්වාද කරන නෑ හිතවත් සියළු දෙනාත් ආදරයෙන් යුතු ව සිහිපත් කරන්නේ හද පිරි සෙනෙහසිනි. පසුබසින සැම විට ම මා නැවත ඔසවා තබමින්, පර්යේෂණයෙහි නිරත වීමට අවැසි සියලු දෑ සම්පාදනය කළ, සැමදා මාගේ ශක්තිය වන දයාබර ස්වාමි පුරුෂයාත්, නිති සෙනෙහස ලබා දුන් දයාබර පුතුත් සිහිපත් කළ යුතු ම ය. ඔබ දෙදෙනාගේ කැප කිරීමත්, ආදරයත් නොවන්නට මෙවැන්නක් බිහි නොවන්නට තිබිණි.

අවසාන වශයෙන් පර්යේෂණ කාර්යයෙහි ලා නන් අයුරින් සහාය දුන් දයාබර සැමට තුති පුද කරමි.

ඩබ්ලිව්. වී. පී. හිමාලිකා රණවීර

# පටුන

*පටුන* *i-iv*

*සංක්ෂිප්තය* *v-vi*

*සංකේත සටහන* *vii*

*වගු සහ සිතියම් පටුන* *viii*

*රූප පටුන* *ix-xi*

**1 පරිච්ඡේදය : හැඳින්වීම** **1-32**

1.1 මාතෘකාව හැඳින්වීම

1.2 අධ්‍යයන ගැටළුව හා උපකල්පනය

1.3 අධ්‍යයනයේ අරමුණු

1.4 අධ්‍යයනයේ වැදගත්කම

1.5 අධ්‍යයන ක්‍රමවේදය

1.6 අධ්‍යයන සීමා

1.7 පරිච්ඡේදකරණය

1.8 සංකල්පීය අධ්‍යයන සැලැස්ම

**2 පරිච්ඡේදය : සාහිත්‍ය සමීක්ෂා** **33-68**

2.1 හැඳින්වීම

2.2 ඊශ්වර දේව සංකල්පය හා බැඳුණු හින්දු ආගමික පසුබිම

2.3 ශ්‍රී ලංකාවේ ඊශ්වර දේව වන්දනාවේ සම්භවය හා ව්‍යාප්තිය

2.4 ඊශ්වර දෙවියන් හා බැඳුණු දේශීය සංස්කෘතිකාංග

2.5 ඊශ්වර වන්දනයෙහි නූතන තත්ත්වය හා භාවිතාව

**3 පරිච්ඡේදය : හින්දු සමය සහ ශිව දෙවි** 69-115

3.1 හැඳින්වීම

3.2 හින්දු ආගම හා ශෛවවාදය

3.3 ශිව දේව වන්දනයේ ඓතිහාසික විකාශනය

3.3.1 ඉන්දුනිම්න ශිෂ්ටාචාරය

3.3.2 වෛදික යුගය

3.3.3 පශ්චාද් වෛදික යුගය

3.4 ශිව දෙවි

3.4.1 ශිව කුටුම්බය

3.4.2 ශිව රූප ලක්ෂණ

3.4.3 ශිව මූර්ති

**4 පරිච්ඡේදය : ශ්‍රී ලංකාවේ ඊශ්වර වන්දනාව - පුරාතන යුගය** 116-152

4.1 හැඳින්වීම

4.2 පුරාතන යුගයේ ලක්දිව ඊශ්වර දේව ඇදහීම

4.2.1 රාවණ රාජ සමය

4.3 ඉපැරණි ඊශ්වර දේවාලය හා බැඳුණු පුරාණෝක්ති

4.3.1 තිරුකේතීශ්වරම් දේවාලය

4.3.2 මුන්නේශ්වරම් දේවාලය

4.3.3 කෝණේශ්වරම් දේවාලය

4.3.4 නගුලේශ්වරම් දේවාලය

4.3.5 සන්තිරසේගරන් දේවාලය

4.4 ඓතිහාසික පුරාවෘත්ත හා සම්බන්ධ වෙනත් දේවාල

**5 පරිච්ඡේදය : ශ්‍රී ලංකාවේ ඊශ්වර වන්දනාව - මධ්‍යතන යුගය** 153-210

5.1 හැඳින්වීම

5.2 අනුරාධපුර යුගය

5.3 පොළොන්නරු යුගය

5.3.1 පොළොන්නරු යුගයේ ඊශ්වර වන්දනයේ ව්‍යාප්තිය

5.3.2 බෞද්ධ සංස්කෘතියෙන් හෙළිවන ඊශ්වර දේව වන්දනාව

5.4 පශ්චාත් පොළොන්නරු යුගයේ ඊශ්වර ඇදහීම

5.4.1 බෞද්ධ ප්‍රතිමා සරය තුළ නිරූපිත ඊශ්වර දෙවියෝ

5.4.2 සිංහල සාහිත්‍ය කලාව තුළ නිරූපිත ඊශ්වර දෙවියෝ

**6 පරිච්ඡේදය : දේශීය සංස්කෘතිකාංගයන්හි නිරූපිත ඊශ්වර දෙවි** 211-256

6.1 හැඳින්වීම

6.2 ගැමි ආගමෙහි පිදුම් ලබන ඊශ්වර දෙවි

6.2.1 බලි ශාන්ති කර්ම

6.2.2 යක් හා දේව ශාන්ති කර්ම

6.3 දේශීය කලා අංග හා ඊශ්වර සංකල්පය

**7 පරිච්ඡේදය : ශ්‍රී ලංකාවේ ඊශ්වර වන්දනාව - නූතන යුගය** 257-310

7.1 හැඳින්වීම

7.2 හින්දු ආගමික සම්ප්‍රදාය හා බැඳුණු ඊශ්වර දේව වන්දනාව

7.2.1 ඊශ්වර වන්දනාව හා බැඳුණු වෙනත් වන්දනා ක්‍රම

7.2.3 ඊශ්වර වන්දනාවේ ව්‍යාප්තිය

7.2.4 ද්‍රවිඩ සමාජයීය ආකල්ප හා විශ්වාස

7.3 ථෙරවාද විහාර සම්ප්‍රදාය හා බැඳුණු ඊශ්වර දේව භූමිකාව

7:3.1 බෞද්ධ සමාජයීය ආකල්ප හා විශ්වාස

7.4 ඊශ්වර වන්දනාවේ ආගමික හා සමාජ මනෝ විද්‍යාත්මක වටිනාකම

සමාලෝචනය 311-317

ආශ්‍රිත ග්‍රන්ථ 318-335

උපග්‍රන්ථ 336-364

රූපාවලිය 365-393

# ශ්‍රී ලංකාවේ ඊශ්වර දේව වන්දනාව

ඩබ්ලිව්.වී.පී. හිමාලිකා රණවීර

**පර්යේෂණ සංක්ෂිප්තය**

ශිව හෙවත් ඊශ්වර යනු හින්දු ආගමට අයත් ප්‍රධාන දෙවි කෙනෙකි. ප්‍රධාන ජන වර්ග දෙකකට පොදු වූ ආගමික සංකල්පයක් ලෙස ඊශ්වර දෙවි ශ්‍රී ලාංකේය ආගමික සංස්ථාවෙහි විශේෂ භූමිකාවක් හොබවයි. ශිව වන්දනය ලංකාවාසී හින්දු ජනතාවගේ මහා සම්ප්‍රදායික ඇදහීම් යටතේ පවත්නා ආගමික විශ්වාසයකි. එසේ ම විවිධ දේව වන්දනාවන්හි නිරත වන බෞද්ධ බැතිමතුන් විසින් බෞද්ධ විහාරස්ථානවලදී මෙන් ම ගැමි ආගමික විශ්වාසයක් වශයෙන් චූල සම්ප්‍රදායික ඇදහීම් යටතේ ද පවත්වාගෙන යන්නා වූ දේව සංකල්පයකි. මේ අයුරින් ශ්‍රී ලාංකේය සංස්කෘතිය තුළ විවිධ පැතිකඩ නියෝජනය කරන දේව සංකල්පයක් වීම නිසා 'ඊශ්වර' ලාංකේය සංස්කෘතියෙහි ක්‍රියාත්මක වැදගත් දේව සංකල්පයක් ව තිබේ.

ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් දේව සංකල්පයක් ලෙස පුරාණෝක්තිගත විශ්වාස පවතින ඊශ්වර දේව වන්දනාව භාරතීය සංස්කෘතික බලපෑම හේතුවෙන් විවිධ කාලවලදී ලාංකේය සමාජය තුළ ව්‍යාප්ත විය. ඊශ්වර දේව වන්දනාව ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වීම හා සමාජගත වීම හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. අධ්‍යයන අරමුණු වෙත එළඹීම සඳහා පුස්තකාලයීය අධ්‍යයනය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයනය ද දත්ත රැස් කිරීමේ දී යොදා ගන්නා ලදී. පුස්තකාලයීය අධ්‍යයනය යටතේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කිරීමත්, ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා හා ප්‍රශ්නාවලි මගින් දත්ත රැස් කිරීමත් සිදු කැරිණි. දත්ත විශ්ලේෂණය ප්‍රධාන වශයෙන් ම විස්තරාත්මක ක්‍රමවේදය යටතේ සිදු කර ඇත. ලංකා ඉතිහාසයේ සුවිශේෂ කාල වකවානුවලදී ඊශ්වර වන්දනාව හින්දු මෙන් ම බෞද්ධ ජනතාව අතර ද ක්‍රියාත්මක වූ ආකාරය හා එහි නූතන භාවිතාව දත්ත විශ්ලේෂණයේ දී හඳුනා ගත හැකි විය.

'ශිව' දෙවියන් සිංහල සමාජය තුළ ජනප්‍රිය ව සිටින්නේ 'ඊශ්වර' නමිනි. ඊශ්වර සංකල්පය සිංහල ගැමි ආගම හා බද්ධ වීමේ දී සම්පූර්ණයෙන් ම බෞද්ධකරණයක් සිදු නොවූ නමුත් යම් පමණකින් දේශීයත්වයට නැගුණු අවස්ථා පවතින බව අනාවරණය විය. ශ්‍රී ලාංකේය හින්දු ආගමික විශ්වාස අතර ශිව දෙවියන් දේව ධුරාවලියේ ඉහළ ම ස්ථානයක සිටී.

එනමුත් හින්දු ත්‍රිමූර්ති සංකල්පය යටතේ නාශක දෙවි කෙනකු ලෙස සමාජගත වීම නිසා වර්තමානයෙහි ක්‍රියාත්මක වන ජනප්‍රිය ආගමික සංස්කෘතික ප්‍රවණතාවන් ඉදිරියේ සාමාන්‍ය ජනතාවගේ දෛනික වන්දනාවන්ගෙන් දුරස් ව ඇති බවක් ප්‍රකට වේ. ශිව දෙවියන් වටා ආරෝපණය වී ඇති විවිධ භෞතික හා අභෞතික ලක්ෂණ මත මෙන් ම, දේව වන්දනාවන්හි නිරත වන බැතිමතුන්ගේ අපේක්ෂා හා විශ්වාස මත දෙවියන් ඇදහීමට දක්වන නාමත්‍රාවෙහි විවිධතා පවතින බව හඳුනා ගැනිණි. අතීතයේ හින්දු හා බෞද්ධ සමාජය තුළ ව්‍යාප්ත වූ වෙනත් දේව විශ්වාස අතර වඩාත් ජනප්‍රිය හා විශේෂ ආගමික සංකල්පයක් වූ ඊශ්වර දේව සංකල්පයේ ආගමික හා සමාජයීය භූමිකාව වර්තමානයේ දී කිසියම් පසුබෑමකට ලක් ව ඇති බව අධ්‍යයනයේ දී අනාවරණය විය. ලාංකේය හින්දු බැතිමතුන්ගේ දේව ධුරාවලියේ ඉහළ ම ස්ථානයේ පසුවන දෙවියා වුවත්, වන්දනා ක්‍රමයක් වශයෙන් සමාජගත වීමේ දී බෞද්ධ මෙන් ම හින්දු බැතිමතුන්ගේ සාමාන්‍ය පුද පූජාවලින් ඊශ්වර වන්දනය දුරස් ව ඇති බව පෙනේ.

# සංකේත සටහන

| | |
|---|---|
| R.V. | Rig Vēda |
| S.K.P.I | Skanda Purāna Part I |
| S.P.I | Siva Purāna Part I |
| S.P.II | Siva Purāna Part II |
| S.P.III | Siva Purāna Part III |
| S.P.IV | Siva Purāna Part IV |
| W.Y | The Text of The White Yajūr Veda |
| U.N.II | The Upanishad Part II |
| බු.අ. | බුදුගුණ අලංකාරය |
| ම.ව. | මහාවංසය |
| යා.පා.ව. | යාපා පටුන වංශ කථාව හෙවත් යාල්පාන වයිපවමාලය |
| ව.කා. | වංසත්ථප්පකාසිනිය |